(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක 385.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

## 2014 අගෝස්තු මස 19 වැනි අඟහරුවාදා අ. භා. 1.00 ට

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2675/'12

1.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— මහාමාර්ග, වරාය හා නාවික අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හම්බන්තොට වරාය ව්‍යාපෘතියට අදාළ ශක්‍යතා අධ්‍යයනයන් සිදු කළ සමාගම් කවරේද;

(ii) එම අධ්‍යයනයන් සිදුකිරීම වෙනුවෙන් එම සමාගම් වෙත ගෙවන ලද මුදල කොපමණද;

(iii) හම්බන්තොට වරාය ඉදිකළ ප්‍රදේශය ආශ්‍රිත වෙරළේ ගල් පර්වතයක් ඇති බව ශක්‍යතා අධ්‍යයන වාර්තා මගින් හෙළි කර තිබේද;

(iv) හම්බන්තොට වරායේ ගල් පර්වතය පුපුරවා හැරීමට දරන ලද මුළු වියදම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3277/'12

2.

ගරු රවි කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2011, 2012 සහ 2013 වර්ෂවලදී ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF) විසින් ශ්‍රී ලංකාවට ලබා දෙන ලද ණය සහ ප්‍රදානයන් සම්බන්ධයෙන්,

(i) ඒවායේ වටිනාකම කොපමණද;

(ii) ණයෙහි කාල පරිච්ඡේදය කවරේද;

(iii) සාමාන්‍ය පොලී වියදම කවරේද;

(iv) ණය හෝ ප්‍රදානයන් ලබා දුන් කොන්ත්‍රාත් හෝ ව්‍යාපෘති කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3627/'13

3.

ගරු රෝසි සේනානායක මහත්මිය,— පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ඇති වගුරු වනාන්තර ප්‍රමාණය කොපමණද;

(ii) එම වනාන්තර පිහිටා ඇති ප්‍රදේශ කවරේද;

(iii) ශ්‍රී ලංකාවේ වගුරු වනාන්තර තුළ ජීවත්වන, හඳුනාගෙන ඇති සත්ව විශේෂ සංඛ්‍යාව කොපමණද;

(iv) එම සත්ව විශේෂ සංරක්ෂණයට ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවට පමණක් ආවේනික "සුවඳ" ශාකය සංරක්ෂණය සඳහා පියවර ගෙන තිබේද;

(ii) එසේ නම්, එම පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3922/'13

4.

ගරු බුද්ධික පතිරණ මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහනුවර නගරය තුළ එක්රැස්වන කැළිකසළ මහනුවර, ගොහාගොඩ ප්‍රදේශයේ මහවැලි ගඟ ආසන්නයේ වූ ස්ථානයකට බැහැර කරන බවත්;

(ii) එම ස්ථානය අසල සත්ව ගොවිපළක් පවත්වාගෙන යනු ලබන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් ස්ථානයේ සත්ව ගොවිපළක් පවත්වාගෙනයෑම සඳහා නීත්‍යානුකූල අවසරයක් ලබා දී තිබේද;

(ii) එසේ නම්, එම අවසරය ලබා දී ඇති ආයතනයේ හෝ ආයතනවල නම් කවරේද;

(iii) එම සත්ව ගොවිපළෙහි හිමිකරුගේ නම සහ ලිපිනය කවරේද;

(iv) එකී සත්ව ගොවිපළේ හිමිකරු එම ව්‍යාපාරයට අමතරව වෙනත් ආයතනයක රැකියාවක් කරනු ලබන්නේ නම්, එම ආයතනයේ නම සහ ඔහු විසින් දරනු ලබන තනතුර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3943/'13

5.

ගරු අනුර දිසානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) 2005 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා කාල සීමාව තුළ පත්කොට ඇති ජනාධිපති කොමිෂන් සභා සංඛ්‍යාව කොපමණද;

(ii) එම කොමිෂන් සභා කවරේද;

(iii) එම එක් එක් කොමිෂන් සභාව සඳහා වැය කර ඇති මුදල් වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ඉහත එක් එක් කොමිෂන් සභාව,

(i) සැදුම්ලත් සාමාජිකයින් සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ සුදුසුකම් කවරේද;

(ii) පත් කිරීමේ අරමුණු කවරේද;

(iii) තම වාර්තා ඉදිරිපත් කර තිබේද;

(iv) එම වාර්තා සභාගත කරන්නේද;

(v) එම වාර්තා මගින් ලබා දී ඇති නිර්දේශයන් ක්‍රියාත්මකකර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4164/’13

6.

ගරු පී. හැරිසන් මහතා,— දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාවේ සිටින ආයුර්වේද වෛද්‍යවරුන්ගේ කාණ්ඩවල නම් කවරේද;

(ii) එම එක් එක් කාණ්ඩයට අයත් වෛද්‍යවරුන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම කාණ්ඩ අතර සිටින සර්වාංග විශේෂඥ වෛද්‍යවරුන් සංඛ්‍යාව දිස්ත්‍රික්ක අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2005 වර්ෂයේ සිට 2013 දක්වා කාල සීමාව තුළ ආයුර්වේද දෙපාර්තමේන්තුව මගින් බලපත්‍ර ලබාදී ඇති සමස්ත සම්බාහන මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම සංඛ්‍යාව, ඒවායේ ලිපිනයන් සමග දිස්ත්‍රික්ක මට්ටමින් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම සම්බාහන මධ්‍යස්ථාන පවත්වාගෙන යාමට අවසර ලබාදී ඇති වෛද්‍යවරුන්ගේ නම් හා ලිපිනයන් කවරේද;

(iv) ආයුර්වේද දෙපාර්තමේන්තුවට අමතරව වෙනත් ආයතන මගින් සම්බාහන මධ්‍යස්ථාන පවත්වාගෙන යාම සඳහා බලපත්‍ර ලබාදී තිබේ නම්, එම ආයතනවල නම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ආයුර්වේද සම්බාහන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම සඳහා තිබිය යුතු අවම වෘත්තීය සුදුසුකම් කවරේද;

(ii) එවැනි මධ්‍යස්ථානයක් පවත්වාගෙන යන ස්ථානයක තිබිය යුතු තත්ත්වයන් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

4318/’13

7.

ගරු අනෝමා ගමගේ මහත්මිය,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) නැගෙනහිර පළාතේ ජනතාවගේ සාක්ෂරතාවය පිළිබඳව අවසන්වරට සමීක්ෂණයක් කරනු ලැබූ වර්ෂය කවරේද;

(ii) නැගෙනහිර පළාතේ මුළු ජනගහනයෙන් කියවීමේ හා ලිවීමේ හැකියාව ඇති ගැහැනු හා පිරිමි ජනගහනයේ ප්‍රතිශතය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) අම්පාර දිස්ත්‍රික්කයේ වයස අවුරුදු 10 දක්වා වූ දරුවන් අතරින් ප්‍රාථමික අධ්‍යාපනය සඳහා යොමු නොවූ දරුවන් සංඛ්‍යාව කොපමණද?

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත විමසා ඇති සංඛ්‍යාත්මක අගයන් ප්‍රමාණවත් මට්ටමක පවතින බවට අධ්‍යාපන බලධාරීන් විසින් පිළිගන්නේද;

(ii) කියවීමේ හා ලිවීමේ හැකියාව අඩුවීමට බලපා ඇති බවට හඳුනාගෙන ඇති හේතු කවරේද;

(iii) එම තත්ත්වය වෙනස් කිරීම සඳහා ක්‍රියාත්මක කරන වැඩපිළිවෙළ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4525/'13

8.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2013 වර්ෂය තුළ භාවිතයෙන් ඉවත් කරන ලද රේල් පීලි විකිණීම සඳහා ටෙන්ඩර් කැඳවූ අවස්ථා ගණන කොපමණද;

(ii) එකී ටෙන්ඩර් කැඳවීම් සිදු කළ දිනයන් කවරේද;

(iii) එම එක් එක් දිනය තුළ කැඳවන ලද ටෙන්ඩරයට අනුව අලෙවි කරන ලද රේල් පීලි ප්‍රමාණය, රේල් පීලි මිලදී ගත් ආයතනය සහ කිලෝග්‍රෑම් එකකට ගෙවන ලද මිල වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4614/'13

9.

ගරු සුජීව සේනසිංහ මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ශ්‍රී ලංකාවේ වත්මන් ඒක පුද්ගල ආදායම සම්මත අයුරින් සහ ශ්‍රී ලංකා රුපියල්වලින් කොපමණද යන්න වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) රටේ ආදායම් උපයනු ලබන පුද්ගලයින් අතර සිටින සමස්ත රාජ්‍ය සේවකයින් සංඛ්‍යාව කොපමණද;

(ii) එම සංඛ්‍යාවෙන් වත්මන් ඒක පුද්ගල ආදායමට සමාන හෝ එයට වැඩි වැටුප් ලබන රාජ්‍ය සේවකයින් සංඛ්‍යාව කොපමණද;

(iii) එය සමස්ත රාජ්‍ය සේවක සංඛ්‍යාවේ ප්‍රතිශතයක් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4758/'14

10.

ගරු අශෝක් අබේසිංහ මහතා,— දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හෝමියෝපති වෛද්‍ය සභාව පිහිටුවූ දිනය කවරේද;

(ii) මේ වන විට හෝමියෝපති වෛද්‍ය සභාව ක්‍රියාත්මක වන්නේද;

(iii) 2012 වර්ෂය වන විට දිවයිනේ ලියාපදිංචි වී සිටි හෝමියෝපති වෛද්‍යවරු සංඛ්‍යාව කොපමණද;

(iv) හෝමියෝපති වෛද්‍ය ක්‍රමය ප්‍රචලිත කිරීම සඳහා අමාත්‍යාංශයෙන් යම් කිසි වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4903/'14

11\.

ගරු තිස්ස අත්තනායක මහතා,— පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මරණීය දණ්ඩනය නියම වූ සිරකරුවන් පිරිසක් 2014 ජනවාරි 04 වැනි දින බෝගම්බර බන්ධනාගාරයේ සිට වැලිකඩ බන්ධනාගාරය වෙත මාරු කරනු ලැබුවේද;

(ii) එසේ නම්, එම සිරකරුවන් සංඛ්‍යාව කොපමණද;

(iii) මේ වන විට ඔවුන් වැලිකඩ බන්ධනාගාරය තුළ රඳවා ගෙන සිටින ස්ථානය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වැලිකඩ බන්ධනාගාරයේ සිටින ඉහත සඳහන් සිරකරුවන්ට වාසය කිරීම සඳහා සුදුසු පරිසරයක් නොමැති බවත්;

(ii) එම හේතුවෙන් ඔවුන් දැඩි දුෂ්කරතාවලට ලක්වී ඇති බවත්;

(iii) එම සිරකරුවන් වැලිකඩ බන්ධනාගාරය වෙත මාරු කරනු ලැබූ දින සිට දැඩි ලෙස අමානුෂික වධ බන්ධනයන්ට ලක් වන බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) සිරකරුවන් මුහුණ පා ඇති මෙම තත්ත්වයන් සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියා මාර්ග කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

4955/'14

12\.

ගරු නිරෝෂන් පෙරේරා මහතා,— මහාමාර්ග, වරාය හා නාවික අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වෙන්නප්පුව නගරයේ සිට කිරිමැටියාන දක්වා දිවෙන ''අළුත් මාවත'' නමැති මාර්ගයේ හැමිල්ටන් ඇළ හරහා ඉදිකරනු ලබන පාලමේ සමස්ත පිරිවැය කොපමණද;

(ii) එම පාලමේ ඉදිකිරීම් කටයුතු පවරා ඇති ආයතනයේ නම කවරේද;

(iii) එම ආයතනය මගින් එකී ඉදිකිරීම සඳහා වෙනත් ආයතනයකට උප කොන්ත්‍රාත් දී තිබේද;

(iv) එසේ නම්, එම උප කොන්ත්‍රාත් ලබාදීම විධිමත් ටෙන්ඩර් පටිපාටියක් අනුව සිදුකර තිබේද;

(v) ඉහත සඳහන් පාලමේ ඉදිකිරීම් අධීක්ෂණය කරනු ලබන ආයතනයේ නම කවරේද;

(vi) එහි ඉදිකිරීම් නිම කිරීමට ගතවන කාලය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත අ (i) හි සඳහන් පාලමේ ඉදිකිරීම් අවසන් වනතෙක් ගමනාගමනය සඳහා තාවකාලික පාලමක් ඉදිකර තිබේද;

(ii) නොඑසේ නම්, වෙන්නප්පුව සිට කිරිමැටියාන දක්වා ඇති විකල්ප මාර්ගය ඔස්සේ ගමන් කිරීමේදී වැඩිපුර ගමන් කළයුතු දුර ප්‍රමාණය කිලෝමීටර කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5024/'14

13\.
ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— විදුලි සංදේශ සහ තොරතුරු තාක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දැයට කිරුළ 2014 යටතේ වයඹ විශ්වවිද්‍යාල භූමියේ, කුලියාපිටිය මධ්‍ය මහා විද්‍යාල භූමියේ සහ කුලියාපිටිය කාර්මික විද්‍යාල භූමියේ සිදු කළ ගොඩනැගිලි ඉදිකිරීම් රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව මගින් සිදු කරනු ලැබුවේද;

(ii) එම ඉදිකිරීම් වෙනත් සමාගම් විසින් සිදු කරනු ලැබුවේ නම්, එම සමාගම්වල නම් කවරේද;

(iii) එම එක් එක් ගොඩනැගිල්ල සඳහා ඇස්තමේන්තුගත මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එකී ගොඩනැගිලි ඉදිකරනු ලැබුවේ කොන්ත්‍රාත් පදනම මතද;

(v) එසේ නම්, ඉදිකිරීම් කොන්ත්‍රාත් ලබා දීමේදී අනුගමනය කරනු ලැබූ ටෙන්ඩර් පටිපාටි කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2677/'12

14\.
ගරු සජිත් ප්‍රේමදාස මහතා,— මහාමාර්ග, වරාය හා නාවික අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හම්බන්තොට ජාත්‍යන්තර වරාය විවෘත කළ දිනයේ සිට මේ දක්වා එම වරායේ මාසික ආදායම සහ වියදම එක් එක් මාසය අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉහත පරිදි වාර්තාවූ ආදායම සහ වියදම අනුව ලැබූ ලාභය හෝ අලාභය එම වරාය සංවර්ධන ව්‍යාපෘතියේ ඉලක්කවලට සාපේක්ෂව සැහීමකට පත්විය හැකි මට්ටමක තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3278/'12

15\.
ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2011, 2012 සහ 2013 වර්ෂවලදී ආසියානු සංවර්ධන බැංකුව (ADB) විසින් ශ්‍රී ලංකාවට දෙන ලද ණය සහ ප්‍රදානයන් සම්බන්ධයෙන්,

(i) ඒවායේ වටිනාකම කොපමණද;

(ii) ණයෙහි කාල පරිච්ඡේදය කවරේද;

(iii) සාමාන්‍ය පොලී වියදම කවරේද;

(iv) ණය හෝ ප්‍රදානයන් ලබා දුන් කොන්ත්‍රාත් හෝ ව්‍යාපෘති කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

## පනත් කෙටුම්පත් පිළිගැන්වීම පිළිබඳ දැනුම්දීම

1.

පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමා,— මහනගර සභා (සංශෝධන),— (252 වැනි අධිකාරය වූ) මහ නගර සභා ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

2.

පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමා,— නගර සභා (සංශෝධන),— (255 වැනි අධිකාරය වූ) නගර සභා ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

3.

පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමා,— ප්‍රාදේශීය සභා (සංශෝධන),— 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

4.

පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමා,— පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන),— (262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

5.

පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමා,— පළාත් පාලන ආයතනවල පුරප්පාඩු පිරවීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන),— 2013 අංක 30 දරන පළාත් පාලන ආයතනවල පුරප්පාඩු පිරවීමේ (විශේෂ විධිවිධාන) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

6.

ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමා,— ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන,— ශ්‍රී ලංකාවේ ඉදිකිරීම් කර්මාන්තයේ සංවර්ධනය සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද; ඉදිකිරීම් කර්මාන්තයේ කටයුතු නියාමනය කිරීම, ලියාපදිංචි කිරීම, විධිමත් කිරීම සහ ප්‍රමිතිකරණය කිරීම සඳහා ද; ඉදිකිරීම් සම්බන්ධ ජාතික උපදේශක සභාව පිහිටුවීම සඳහා ද; ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය පිහිටුවීම සඳහා ද; ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අරමුදල සහ ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ අරමුදල පිහිටුවීම සඳහා ද; කර්මාන්තයට අදාළ වෘත්තිකයන්, නිෂ්පාදකයන්, සැපයුම්කරුවන්, කොන්ත්‍රාත්කරුවන් සහ ශිල්පීන්ගේ දියුණුව සහ සුභසාධනය සඳහා විධිවිධාන සැලසීම පිණිස ද; ඉදිකිරීම් කටයුතුවලට අදාළ ආරවුල් නිරවුල් කිරීම සහ ඒ හා සම්බන්ධිත හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලස්වීම පිණිස වූ පනත් කෙටුම්පතකි.

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

අධිකරණ අමාත්‍යතුමා,— බෙදුම් නඩු පනත යටතේ නියෝග,— ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 21 දරන බෙදුම් නඩු පනතේ 8 වැනි සහ 29 වැනි වගන්ති සමග කියවිය යුතු, එකී පනතේ 82අ වැනි වගන්තිය යටතේ අධිකරණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2014 ජූලි මස 18 දිනැති අංක 1871/42 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2014.08.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතුය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*2.

ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාල පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*3.

කාලාවරෝධ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2014 අගෝස්තු මස 07) [1]

*4.

පතල් හා ඛනිජ ද්‍රව්‍ය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*5.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 1),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ අන්‍යෝන්‍ය වශයෙන් සුරක්ෂණය පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ කුවේට් රාජ්‍යයේ ආණ්ඩුව අතර 2009 නොවැම්බර් මස 05 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*6.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 2),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ සුරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ වියට්නාම සමාජවාදී ජනරජයේ ආණ්ඩුව අතර 2009 ඔක්තෝබර් මස 22 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*7.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 3),— 2014.08.05 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ අන්‍යෝන්‍ය වශයෙන් සුරක්ෂණය පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ චෙක් ජනරජයේ ආණ්ඩුව අතර 2011 මාර්තු මස 28 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*8.

ප්‍රවාහන අමාත්‍යතුමා,— මෝටර් වාහන පනත යටතේ නියෝග,— (203 වැනි අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 5 වැනි වගන්තියේ (2) වැනි උපවගන්තිය සහ 19 වැනි වගන්තිය සමග කියවිය යුතු, එකී පනතේ 237 වැනි වගන්තිය යටතේ ප්‍රවාහන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2013 ජුලි 31 දිනැති අංක 1821/31 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2013.11.22 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*9.

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යතුමා,— සේවක අර්ථසාධක අරමුදල පනත යටතේ නියෝග,— කලින් කල සංශෝධිත 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල පනතේ 46 වැනි වගන්තිය යටතේ කම්කරු සහ කම්කරු සබඳතා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2013 මැයි 13 දිනැති අංක 1810/20 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2013.06.21 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*10.

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා,— හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ නියෝග,— 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 60 සහ 62 වැනි වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 67 වැනි වගන්තිය යටතේ ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2009 අගෝස්තු 24 දිනැති, අංක 1616/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.05.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*11.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත යටතේ නියමය,— (469 වැනි අධිකාරය වූ) වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2011 දෙසැම්බර් 06 දිනැති අංක 1735/21 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.12.13 දින ඉදිරිපත් කළ නියමය අනුමත කළ යුතු ය.

*12.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් - 2011,— 1999 අංක 38 දරන පාර්ලිමේන්තු පනතින් ස්ථාපනය කරන ලද විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ 2013.09.04 වැනි දින ඉදිරිපත් කරන ලද, 2011.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණය ඇතුළත් විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2013.09.13 දින සලකා බලන ලදී.)

*13.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් - 2011,— 1983 අංක 54 දරන පාර්ලිමේන්තු පනතින් ස්ථාපනය කරන ලද ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ 2013.11.22 වැනි දින ඉදිරිපත් කරන ලද, 2011.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණය ඇතුළත් ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.07 දින සලකා බලන ලදී.)

*14.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ වාර්ෂික වාර්තාව - 2011,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30 (2) වගන්තිය යටතේ 2013.10.10 දින ඉදිරිපත් කරන ලද 2011 ජනවාරි 01 දින සිට 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද, විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණය ඇතුළත් ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.21 දින සලකා බලන ලදී.)

15.

ශ්‍රී ලංකා කාන්තා සම්මේලනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

16.

රණ කලා ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

17.

ද ඉන්ස්ටිටියුට් ඔෆ් සර්ටිෆයිඩ් පබ්ලික් එකවුන්ටන්ට්ස් (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

18.

අල් ජමියාතුල් හ්හව්සියා (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

---

[1]

"පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය" යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

---